**කොවිඩ් -19 සති පාසල - සබරගමුව**
**(නිවිතිගල අධ්‍යාපන කලාපය)**
**විෂය - පෙරදිග සංගීතය ශ්‍රේණිය - 9 සතිය - 01**
**පාඩම - නූර්ති ගීතයක් ගායනය**

**නිපුණතාව 6.0 -** රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** - නූර්ති ගී ගායනයේ කුසලතා ලබයි.

**ක්‍රියාකාරකම 6.1.1** - නූර්ති ගීතයක් ගායනය

**ඉහත 6.1.1 ක්‍රියාකාරකමට අදාළ ව ඔබට සපයා ඇති පහත අංක 01, 02, 03 පැවරුම් සම්පූර්ණ කරන්න.**

## පැවරුම - 01

- ❖ අන්තර්ජාලය මගින් හෝ ගීතය තැටිගත කළ සංගත තැටියක් උපයෝගී කර ගනිමින් හෝ ඔබට සපයා ගත හැකි ආකාරයකින් "ආරණ්නේ ඉන්නා මේ"නැමැති නූර්ති ගීතය සපයාගෙන කිහිප වාරයක් හොඳින් ශ්‍රවණය කරන්න.
- ❖ ඉන් අනතුරුව පහත දක්වා ඇති ගීතයේ වචන නිවැරදි ව උච්චාරණය කරමින් ගායනා කරන්න

ආරණ්නේ ඉන්නා මේ රම්‍යා කතේ -ශ්‍රියා කාන්තාව සේ මා පෙනේ

ශ්‍රියා කාන්තාව සේ මා පෙනේ //

ආරණ්නේ ඉන්නා මේ...

සදමින ශෝක මාල වෘක්ෂේ මෙ ඉන්නා - කවුද තී රම්‍යාකතේ

චණ්ඩාල ගෝත්‍රේ චණ්ඩාල කන්‍යා //

ප්‍රේමිට හෘදේ පුදම්- රතීසරී

ප්‍රේමිට හෘදේ පුදම්...

## පැවරුම - 02 (ලිඛිත)

1. "ආරණ්නේ ඉන්නා" මෙම නූර්ති ගීතය අයත් නූර්ති නාටකය නම් කරන්න.

11. ඔබ අසා ඇති නූර්ති නාට්‍ය නිෂ්පාදකයින් දෙදෙනෙකු නම් කරන්න.

111.නූර්ති ගීත ගායනයේදී යොදා ගෙන ඇති වාද්‍ය භාණ්ඩ 4ක් නම් කරන්න.

## පැවරුම - 03

- ❖ නූර්ති ගීත ඇතුළත් පොත් පිංචක් සකස් කරන්න.